# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2054/7 - 2018 ජනවාරි මස 15 වැනි සඳුදා - 2018.01.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 24/1951 (xiv)

**මෝටර් වාහන පනත (203 වැනි අධිකාරය)**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5, 19, 141 සහ 142 වන වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2018 ජනවාරි මස 15 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2018 අංක 03 දරන මෝටර් වාහන (කොඩ්‍රිසයිකලය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. කුලී පදනම යටතේ හෝ අන්‍යාකාරයකින් පුද්ගලයින් සහ භාණ්ඩ ප්‍රවාහනය කරනු ලැබීමේ කාර්ය සඳහා කොඩ්‍රිසයිකලයක් භාවිත කරනු ලබන සෑම අයිතිකරුවකු ම, එම වාහනය ධාවනය කරන අවස්ථාවල දී එම කොඩ්‍රිසයිකලයේ දොරවල් සම්පූර්ණයෙන් වසා ඇති බවට වග බලා ගත යුතු ය.

3. කොඩ්‍රිසයිකලයක යම් අයිතිකරුවකු විසින් -

(අ) කොඩ්‍රිසයිකලයේ උස එහි පළල මෙන් සියයට එකසිය පනහකට වඩා අඩු විය යුතු බවට ;

(ආ) වාහනයේ පහත්ම ස්ථානය හරහා යන තිරස්තලය හා පොළොව අතර පරතරය, රෝද අතුරට දරන අනුපාතය අටට වඩා අඩු විය යුතු බවට ;

(ඇ) ලීවර සහිත යාන්ත්‍රණයක් නොවන්නා වූ දකුණු පසින් පදවන යාන්ත්‍රිකව පහසුවෙන් හැසිරවිය හැකි සුක්කානම් යාන්ත්‍රණයක් වාහනයේ සවි කර ඇති බවට ;

(ඈ) සුක්කානමක් මගින් මෙහෙයවනු ලබන සුක්කානම් යාන්ත්‍රණය වාහනයට සවි කර ඇති බවට ;

(ඉ) එක් එක් ආසනය ඉදිරිපස කෙලවර ඍජු රේඛාවක් ඔස්සේ මනින ලද, වැඩිහිටියකු සඳහා අවම වශයෙන් මිලිමීටර් 382 ක අසුන් ගැනීමේ ප්‍රදේශයක් සහිත තත්ත්වයෙන් කොඩ්‍රිසයිකලයක සියලු ආසනවල ආධාරක නිසි පරිදි ස්ථානගත කර ඇති ලෙස වග බලා ගත යුතු ය ;

එසේ වුව ද, ළමයින් සඳහා වන විට එක් එක් ආසනයේ ඉදිරි කෙලවර ඍජු රේඛාවක් ඔස්සේ මනින ලද මිලිමීටර් 230 ක් වූ ඉඩ ප්‍රමාණයක් සලසා තිබිය යුතු බවට,

1A - PG 3885 — 507 (2018/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඊ) කොට්‍රිසයිකලයක රියදුරු අසුනේ ඉදිරිපස කෙළවර සහ උපකරණ පුවරුවේ ආසන්නතම ස්ථානය හරහා ගමන් කරන සිරස් තලය අතර ඇති කෙටිම දුර මිලිමීටර් 300 ට වඩා අඩු නොවිය යුතු බව ට;

(උ) කොට්‍රිසයිකලයක මගී අසුන්වල ඉදිරිපස කෙළවර සහ ඉදිරිපස අසුනක පිට ඇන්දේ ආසන්නතම ස්ථානය හරහා ගමන් කරන සිරස් තලය අතර ඇති කෙටිම දුර ප්‍රමාණය මිලිමීටර් 230 ට වඩා අඩු නොවිය යුතු බවට ;

(ඌ) කොට්‍රිසයිකලයක එක ළඟ සවි කර ඇති ආසන දෙකෙහි පිට ඇන්ද අතර අවම නිදහස් පරතරය මිලමීටර් 660 කට වඩා අඩු නොවිය යුතු බවට ;

(එ) එකිනෙකට මුහුණලා ඇති ආසන කොට්‍රිසයිකලයට සවි නොකළ යුතු බවට ;

(ඒ) හයිඩ්‍රොලික් පා තිරිංග යාන්ත්‍රණයක් කොට්‍රිසයිකලයට සවි කළ යුතු බවට,

වග බලා ගත යුතු ය.

4. කොට්‍රිසයිකලයේ වේගය පැයට කිලෝමීටර් 50 ක් විය යුතු ය.

5. කොට්‍රිසයිකලයක අයිතිකරු හෝ රියදුරු විසින් එම කොට්‍රිසයිකලයක් මාර්ගයේ ගමන්කරන අතරතුර දී යම් වෙළඳ දැන්වීම්, පත්‍රිකා හෝ අත්පත්‍රිකා බෙදීම සඳහා කිසිදු තැනැත්තකුට අවසර නොදිය යුතු ය.

6. කොට්‍රිසයිකලයක රියදුරුකු විසින්, එම කොට්‍රිසයිකලයක ගමන් කරන හෝ නවතා තබා ඇති විටක දී මාර්ග භාවිතා කරන වෙනත් අයට හිරිහැර හෝ පීඩා සිදුවන ශබ්දයක් උපදවන යම් උපකරණයක් හෝ උපාංගයක් භාවිත කිරීම හෝ භාවිත කිරීමට කටයුතු සැලැස්වීම නොකළ යුතු ය. එම ශබ්දය, කොට්‍රිසයිකලයකට සීමා වන ලෙස පාලනය කළ යුතු අතර එම ශබ්දය එහි සිටින මගීන්ට පමණක් ශ්‍රවනය කිරීම සඳහා වන පරිදි විය යුතු ය.

7. (1) කොට්‍රිසයිකලයක අයිතිකරුවකු හෝ රියදුරකු විසින් -

(අ) කොට්‍රිසයිකලයක වේග මීටරය, එම කොට්‍රිසයිකලය ධාවනය කරනු ලබන සියලු අවස්ථාවල දී එහි රියදුරාට පැහැදිලිව දක්වන පරිදි එකී කොට්‍රිසයිකලයක වේග මීටරයට සවි කර ඇති බවට සහතික විය යුතු ය ;

(ආ) කොට්‍රිසයිකලයේ රියදුරු හට බාධා විරහිත ඉදිරිපස දර්ශනයක් ලබා ගැනීම සඳහා සුදුසු වන පරිදි විද්‍යුත් මාර්ගයෙන් හෝ ඉලෙක්ට්‍රොනික ලෙස ක්‍රියාත්මක වන වාමුවා පිස්න කොට්‍රිසයිකලයට සවිකර ඇති බවට සහතික විය යුතු ය ;

(ඇ) කොට්‍රිසයිකලයට එකම ප්‍රමාණයේ වායු ටයර් හතරක් සවි කළ යුතු අතර එම කොට්‍රිසයිකලය මාර්ගයක භාවිත කරනු ලබන අතරතුර දී ඇක්සලයට රෝදයක් ඉක්මණින් සවි කිරීම සඳහා අවම වශයෙන් එක් අතිරේක රෝදයක් අවශ්‍ය වන අතර රෝදය සවි කිරීමට අවශ්‍ය වෙනත් උපාංග රැගෙන යාමට සහතික විය යුතු ය ;

(2) පහත දැක්වෙන උපාංග කොට්‍රිසයිකලයට සවි කර ඇති බවට සහ ඒවා හොඳ තත්ත්වයෙන් සහ ක්‍රියාත්මක තත්ත්වයෙන් පවතින බවට කොට්‍රිසයිකලයක අයිතිකරුවකු විසින් සහතික විය යුතු ය :-

(අ) බාහිර පිටුපස දර්ශන කණ්නාඩි දෙක ;

(ආ) ප්‍රධාන සහ අවපාත කළ හැකි ප්‍රධාන ලාම්පු සහ දර්ශක ;

(ඇ) අවර හෝ නැවතුම් ලාම්පු ;

(ඈ) පැති දිසා දර්ශක ;

(ඉ) පිටුපස ධාවන සඳහා ලාම්පුව ;

(ඊ) අභ්‍යන්තර ලාම්පු දෙකක් ;

(උ) නවතා තැබීමේ ලාම්පු ; සහ

(ඌ) නලාව.

8. ගාස්තුවක් සඳහා හෝ යම් ප්‍රතිලාභයක් සඳහා මගීන් හෝ භාණ්ඩ ප්‍රවාහනය කිරීමේ කාර්ය සඳහා කොඩ්‍රිසයිකලය භාවිත කරනු ලබන අවස්ථාවක දී :-

(අ) මගීන්ට පැහැදිලිව දර්ශනය වන පරිදි රියදුරු අසුන පිටුපස පහත සඳහන් තොරතුරු ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය:-

(i) වාහනය ලියාපදිංචි කිරීමේ අංකය ;
(ii) රියදුරුගේ නම සහ රියදුරු බලපත්‍ර අංකය ;
(iii) රියදුරුගේ ඡායාරූපයක් (මිලිමීටර් 65X50 ප්‍රමාණයේ) ;
(iv) හදිසි අවස්ථාවක දී දැනුම් දීම සඳහා වාහනය ලියාපදිංචියට අදාළ පොලිස් ස්ථානවල දුරකථන අංක ;

(ආ) කොඩ්‍රිසයිකලයක රියදුරු විසින් :-

(i) ආචාර සම්පන්න සහ විධිමත් ආකාරයට හැසිරිය යුතු ය ;
(ii) දුම් පානය නොකළ යුතු ය ;
(iii) කුලී ගමන අවසන් වන ස්ථානය වන තෙක් ගමන අවසන් නොකළ යුතු ය ; සහ
(iv) මගියා විසින් අන්‍යාකාරයකින් ඉල්ලා සිටින්නේ නම් මිස යා හැකි කෙටිම ගමන් මාර්ගය ඔස්සේ අඩුම කාලයක් ඇතුළත මගීන්ගේ ගමනාන්තය දක්වා ඔවුන් ආරක්ෂිතව ගෙන යා යුතු ය.

9. (1) කුලී පදනම යටතේ හෝ අන්‍යාකාරයෙන් තැනැත්තන් හෝ භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා කොඩ්‍රිසයිකලයක් භාවිත කරනු ලබන එහි සෑම අයිතිකරුවකු විසින් ම කුලී ගමනේ සෑම අවස්ථාවක දී ම ක්‍රියාත්මකව තිබිය යුතු ටැක්සි මීටරයක් සවි කළ යුතු අතර මගීන්ට පහසුවෙන් සහ පැහැදිලිව දර්ශනය වන ලෙස වහලයේ ඉදිරි කෙළවර මත ''ටැක්සි'' යන යෙදුම ප්‍රදර්ශනය සඳහා සෙන්ටිමීටර් 10 ක් නොඉක්මවන උසක් සහිත පුවරුවක් සවි කළ යුතු ය.

(2) එම කුලී මුදල ගෙවීමෙන් පසුව, තත්කාර්ය සඳහා රිසිට්පතක් නිකුත් කිරීම කොඩ්‍රිසයිකලයක රියදුරුගේ වගකීම විය යුතු ය. එම රිසිට්පතට ගමන් කළ දුර ප්‍රමාණය, වාහන ලියාපදිංචි කිරීමේ අංකය, අය කළ ගාස්තුව සහ රිසිට්පත් දිනය ඇතුළත් විය යුතු ය.

10. නිෂ්පාදකයා විසින් ලකුණු කර ඇති විස්තර තොරතුරු හැර කිසිදු අකුරු, රූප හෝ ඉලක්කම් කොඩ්‍රිසයිකලයේ ඉදිරිපස හෝ පිටුපස සලකුණු කර නොමැති බවට සහතික විය යුතු ය.

11. මේ නියෝගවල ''කොඩ්‍රිසයිකලය'' යන යෙදුම සඳහා (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

02 - 31

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.